චක්‍රලේඛ ලිපි අංක: 02 - 142/2015

මගේ අංකය: HP/HI/Dir/AW/2015-04
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ නා හිමි මාවත,
කොළඹ – 10.
2015.10.28

සියළුම සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (තෘතියික සත්කාර සේවා),
අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා),
අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය),
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන් / වෛද්‍ය අධිකාරීවරුන් / රෝහල් භාර වෛද්‍ය නිලධාරීන්,
සියළුම පෞද්ගලික රෝහල් ප්‍රධානීන්,

**<u>උපත් ලියාපදිංචි කිරීමට පහසුකම් සැලසීම</u>**
**<u>රෝහලේදී සිදුවන උපතක් සම්බන්ධ විස්තර (B-148) පත්‍රිකාව ක්‍රියාත්මක කිරීම</u>**

උපත් ලියාපදිංචි කිරීම රටක ජෛව සංඛ්‍යාන පවත්වාගෙන යාම සඳහා වන මූලික අවශ්‍යතාවයකි. රටේ සිදුවන දරු උපත්වලින් 100%කට ආසන්න සංඛ්‍යාවක්ම මෑතක සිට රෝහල්ගතව සිදුවන නිසා දරු උපත් ලියාපදිංචිය සඳහා සෞඛ්‍ය අංශය මඟින් පහසුකම් සැලසීමට තීරණය කරන ලදී. මේ සඳහා වන ආදානයන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් සහ රෝහල් අධ්‍යක්ෂවරුන්ගේ හමුවේදී ලබා ගන්නා ලදී.

ඔබගේ රෝහලේ සිදුවන සජීවී දරු උපතක් පිළිබඳ විස්තර වාර්තා කිරීම සඳහා "රෝහලේදී සිදුවන උපතක් සම්බන්ධ විස්තර (B-148)" පත්‍රිකාව යොදා ගැනීමට මෙයින් උපදෙස් දෙනු ලැබේ. එය පුරවා දරු උපත ලියාපදිංචිය සඳහා උපත් හා මරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කළ යුතුය.

දැනට පවත්නා පත්‍රිකාවේ අංක 1 සිට 5 දක්වා වන කොටස් (උපන් දිනය, ළමයාගේ නම, ස්ත්‍රී/පුරුෂ භාවය, උපත් බර, නිවුන් දරු උපතක් නම්, දරුවන් ගණන) පමණක් පිරවීම සඳහා රෝහල් ප්‍රධානියා වගකිවයුතු බව කාරුණික අවධානයට ලක් කරමි. තවද, එම පත්‍රිකාවේ පහලින් අත්සන් තැබීමෙන් එහි 6 සිට 8 දක්වා කොටස් සඳහා රෝහල් ප්‍රධානියා කිසිදු වගකීමක් නොදරන බව දන්වා සිටිමි. (*මෙම පත්‍රිකාවේ මීළඟ මුද්‍රණයේ සිට මෙම 1 සිට 5 දක්වා කොටස් සඳහා පමණක් වගකියන බවට සඳහනක් ඇතුලත් කරනු ඇත*).

මෙම පත්‍රිකාවේ මීළඟ මුද්‍රණය භාවිතය සඳහා ලැබෙන තුරු දැනට පවත්නා පත්‍රිකාව භාවිතයට ගන්නා මෙන් මෙයින් උපදෙස් දෙනු ලැබේ.

වෛද්‍ය. පී.ජී. මහීපාල
**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**
**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

පිටපත: රෙජිස්ට්‍රාර් ජනරාල් - ඔබගේ දැනගැනීම හා ඉදිරි කටයුතු සඳහා